**<u>2020 වර්ෂයේ විද්‍යාපීඨ අයදුම්කරන්නන් වෙත කෙරෙන විශේෂ දැනුම් දීමයි.</u>**

- 2020.09.04 දිනැති ගැසට් නිවේදනයේ පාඨමාලා අංක 49 හා 50 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (සිංහල හා දෙමළ මාධ්‍ය) පාඨමාලා සඳහා අයදුම් කිරීමේ සුදුසුකම් පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බව සලකන්න.

| |
|---|
| පාඨමාලා අංකය 49 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (සිංහල)<br>50 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (දෙමළ) |

4.28

4.28.1 2018 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ගිණුම්කරණය, ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව යන වාණිජ්‍ය විෂය ධාරාවට අයත් විෂයයන් තුන (03) හෝ එයින් විෂයයන් දෙකක් (02) සමඟ තුන්වන විෂයය වශයෙන් පහත සඳහන් කර ඇති එක් විෂයයක් සමඟ විෂයයන් තුනකින් (03) හෝ එකවර සමත් වීම;

- ව්‍යාපාර සංඛ්‍යානය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, ඉතිහාසය, තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය, ඉංග්‍රීසි, ජර්මන්, ප්‍රංශ, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හෝ ගණිතය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය,භෞතික විද්‍යාව

හා

4.28.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය හෝ ව්‍යවසායකත්ව අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමර්ථයක් සහිත ව සමත්වීම.